අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

+9411 2784161
+9411 2784869
moepressroom3@gmail.com

මාධ්‍ය නිවේදනය | ஊடக வெளியீடு | MEDIA RELEASE

MEDIA UNIT

2025-06-14

# බලංගොඩ රජවක මහා විද්‍යාලයේ සිදුවීම සම්බන්ධයෙන් මූලික විමර්ශනයක්.

## අනාරක්ෂිත බවට සැක ගස් පාසලේ ඇත්නම් වහාම ප්‍රාදේශිය ලේකම්ට සහ දැව සංස්ථාවට දැනුම් දෙන්න

- අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍ය වෛද්‍ය මධුර සෙනෙවිරත්න

බලංගොඩ රජවක මහ විදුහලේ සිදුවීම සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් සිදු කර සතියක් තුළ වාර්තාවක් ලබා දෙන ලෙසත්, අනාරක්ෂිත බවට සැක කරන ගස් පාසල් භූමිය තුළ ඇති නම් වහාම ප්‍රාදේශිය ලේකම්ට සහ දැව සංස්ථාවට දැනුම් දෙන ලෙසත් අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍ය වෛද්‍ය මධුර සෙනෙවිරත්න මහතා පැවසීය.

බලංගොඩ රජවක මහා විද්‍යාලයේ බෝ ගසක කොටසක් කඩා වැටීම හේතුවෙන් සිදු වූ හානිය නිරීක්ෂණය කරමින් වෛද්‍ය මධුර සෙනවිරත්න මහතා මේ බව සඳහන් කළේය.

මෙම සිදුවීම සම්බන්ධයෙන් කමිටුවක් පත්කර මූලික විමර්ශනයක් සිදු කරන ලෙසත්, එහි වාර්තාව සතියක් තුළ ලබා දෙන ලෙසත්, එම වාර්තාව අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා ලෙස නියෝජ්‍ය අමාත්‍යවරයා මෙහිදී නිලධාරීන්ට පැවසීය.

මේ සම්බන්ධයෙන් වගකීම් පැහැර හැරීමක් සිදුවී ඇතිද යන්න පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරන ලෙස නියෝජ්‍ය අමාත්‍යතුමන් නිලධාරීන්ට දන්වා සිටියේය. විනාශ වූ ගොඩනැගිල්ල වෙනුවට නව ගොඩනැගිල්ලක් ඉදිකිරිමට අවශ්‍ය කටයුතු සලසන ලෙසද අමාත්‍යවරයා පැවසීය.

ඒ අනුව සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් අතිරේක පලාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් දෙදෙනෙකු සහ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂකවරයෙකු ගෙන් සමන්විත ත්‍රිපුද්ගල කමිටුවක් පත්කර ඉදිරි විමර්ශන සිදු කරන බව සබරගමුව පලාත් අධ්‍යාපන අධ්‍යක්ෂ දර්ශනී ඉද්දමල්ගොඩ මහත්මිය පැවසීය.

මේ වන විට බලංගොඩ මූලික රෝහලේ ප්‍රතිකාර ලබන අනතුරට පත් දරුවන්ගේ සුවදුක් විමසීමට ද නියෝජ්‍ය අමාත්‍ය වෛද්‍ය මධුර සෙනෙවිරත්න මහතා කටයුතු කළේය. අනතුරින් තුවාල ලබා රෝහල් ගත කළ පිරිසෙන් හය දෙනෙකු පමණක් රෝහලේ ප්‍රතිකාර ලබන බවත්, ඉතිරි පිරිස ප්‍රතිකාර ලබා පිටව ගිය බවත් බලංගොඩ මූලික රෝහලේ වෛද්‍ය අධිකාරී කේ. ඒ. එල්. එල්. කේ ආරච්චි මහතා පැවසීය. ප්‍රතිකාර ලබන දරුවන් වෙත සුරක්ෂා රක්ෂණාවරණය මගින් වන්දි ලබා දීම හෝ අවශ්‍ය කටයුතු සිදු කිරීම කඩිනම් කරන ලෙස මෙහිදී නියෝජ්‍ය අමාත්‍යවරයා උපදෙස් ලබා දුන්නේය.

අනතුරුව මෙම සිද්ධියෙන් ජීවිතක්ෂට පත් බලංගොඩ, බිබිලේවෙල ප්‍රදේශයේ පදිංචි කලා අංශයේ ඉගෙනුම ලැබූ කිවිර හිරුජය නැමැති 17 හැවිරිදි සිසුවාට අවසන් ගෞරවය දැක් වීමට නියෝජ්‍ය අමාත්‍ය මධුර සෙනෙවිරත්න මහතා සහභාගී විය. සිද්ධිය සම්බන්ධයෙන් රජයේ කණගාටුව ප්‍රකාශ කළ

නියෝජ්‍ය අමාත්‍යතුමන් මියගිය දරුවා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ අපදා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ මැදිහත් වීමෙන් එම පවුලට සාධාරණයක් ඉටු කරන ලෙසත් දන්වා සිටියේය.

සිසුවාගේ අවසන් කටයුතු අද දින සිදු කරන අතර අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, පළාත් සභාව ඒ වෙනුවෙන් විශේෂ මැදිහත්වීමක් සිදු කරන ලෙසද නියෝජ්‍ය අමාත්‍ය මධුර සෙනෙවිරත්න මහතා පැවසීය.

දරුවන් ගේ ආරක්ෂාවට මූලික තැනක් ලබා දිය යුතු බවත්, පාසල තුළ අනාරක්ෂිත යැයි හැඟෙන ගස් තිබේ නම් වහාම ප්‍රාදේශීය ලේකම්ට, දැව සංස්ථාවට සහ පළාත් අධ්‍යාපන කාර්යාලයට දැනුම් දෙන ලෙසත්, අදාල අංශ ඒ වෙනුවෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගතයුතු බවත් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍ය වෛද්‍ය මධුර සෙනෙවිරත්න මහතා මෙහිදී පැවසීය.

මෙම අවස්ථාවට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන වසන්ත පුෂ්පකුමාර, සුනිල් රාජපක්ෂ, බලංගොඩ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ප්‍රභාත් වර්ණසූරිය, ඇතුළු පිරිසක් සහභාගී වූහ.

මාධ්‍ය ඒකකය.

"ඉසුරුපාය", බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. "இசுருபாய", பத்தரமுல்ல, இலங்கை. "Isurupaya", Battaramulla, Sri Lanka.
+9411 2785141-50 +9411 2784848 education@moe.gov.lk www.moe.gov.lk